# 2017 ගාලු කතිකාවත (Galle Dialogue) සමාරම්භක උත්සවයේදී අද්මිරාල් ස්කොට් ස්විෆ්ට් විසින් පල කරන ලද අදහස්

මා හඳුන්වාදීම පිළිබඳව ස්තූතියි.

සුභ උදෑසනක් නෝනාවරුනි, මහත්වරුනි, අද උදෑසන ඔබ සමග මෙම ස්ථානයේ ගත කිරීමට ලැබීම මට ඉමහත් සතුටකි. අපගේ සත්කාරකයින් වන ශ්‍රී ලංකා නාවික හමුදාවටත් විශේෂයෙන් නාවික හමුදාපති අද්මිරාල් සින්නයියා මහතාටත් මා විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි. නාවික සහ සමුද්‍රීය කටයුතුවලට නායකත්වය සපයන පුද්ගලයින් හට තමන් හට සාකච්ඡා කිරීමට ඇති වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා වූ තීරණාත්මක වැදගත්කමක් සහිත ඉසව්වක් ලෙස ගාලු කතිකාවත මූලාරම්භය හැඳින්විය හැකිය. මෙය බටහිර ශාන්තිකර නාවික සම්මේලනය ( Western Pacific Naval Symposium) ද ශැන්ග්‍රිලා ඩයලොග් සහ ඉන්දියන් සාගර නාවික සම්මේලනය ආදී කලාපීය සහ ගෝලීය වේදිකාවන් තුල සිදුවෙමින් පවතින කථිකාවේ තවත් එක් වැදගත් කොටසක් වේ. පසුගිය වසරේදී ගාලු කතිකාවත සාකච්ඡාව ප්‍රමාණයෙන් විශාල වූ මෙම ස්ථානය කරා වෙනස් කිරීමට සිදු වීමෙන් පෙනී යන්නේ කලාපීය හා ගෝලීය වශයෙන් එහි වැදගත්කම පුළුල් වෙමින් පවතින බවයි.

නාවික ක්ෂේත්‍රයේ මෙවන් ගෞරවනීය නායකයින් කණ්ඩායමක් තුළ මටද අවස්ථාවක් ලැබීම පිළිබඳව මා ඉතාමත් සතුටට පත් වෙමි. ලොව සියලු මහාද්වීප නියෝජනය කරන නියෝජිතයින් අද මෙම ස්ථානයට රැස්ව සිටින අතර මින් පැහැදිලි වන්නේ සාගර කොතරම් ප්‍රබල ලෙස අප එක් කරනවාද යන්නයි. අද මෙම ස්ථානය තුළ මතුවන විවිධ වූ අදහස් සහ අත්දැකීම් වලින් බොහෝ දේ ඉගෙනීමට මා බලාපොරොත්තු වෙමි.

මා මින් පෙර සඳහන් කළ පරිදි අප සියළු ජාතීන් එක් කරන්නේ සාගරයයි. වසර මිලියන ගණනක් තිස්සේ ත්‍රාසජනක අත්දැකීම් වලට ලොබ බැඳි මිනිසුන් ලොව සයුරු හත හරහා වෙළඳාම ජනතාව සහ අදහස් ලොව ඉතා දුර බැහැර ප්‍රදේශ දක්වා හුවමාරු කිරීමට සුළඟ සහ දියවැල් උපයෝගී කොට ගත් අතර මෝසම් සුළං විසින් රුවල් යුගය පාලනය කළ කාලයේදී ස්ථාපිත වූ එකී මුහුදු මාර්ග ලොව පුරා සෑම රටකම පාහේ සංවර්ධනයට සහ සෞභාග්‍යයට ඉවහල් වී ඇත.

එම ගතිකය තවමත් නොවෙනස්ව පවතින අතර අදටත් ජාත්‍යන්තර වෙළඳාමෙන් සියයට අනූවක් පමණ සිදුවන්නේ මුහුදු ප්‍රවාහන මාර්ග හරහාය. විශාල වශයෙන් එකිනෙකා මත යැපෙන ගෝලීය ආර්ථිකයන් තුළ ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් අප සියළු දෙනා හටම පැවරෙන්නේ එක හා සමාන වගකීමකි.

සාමූහික වශයෙන්න අප විසින් ජාත්‍යන්තර සම්මතයන්, ප්‍රමිතීන්, නීති සහ පිළිවෙත්වලට ගරු කිරීම සහ ඒවාට අනුගතවීම හේතුවෙන් පසුගිය වසර 70 තුළ ආසියා ශාන්තිකර කලාපය පෙර නොවූ විරූ අන්දමේ ස්ථාවරත්වයක් සහ සෞභාග්‍යයක් අත්පත් කොට ගෙන ඇත. එකී සම්මතයන් රටවල් විසින් එකිනෙකා මත පටවනු ලැබූ ඒවා නොවීමත් ප්‍රමාණය, හමුදා ශක්තිය හෝ ආර්ථික බලය ආදී කරුණු පිළිබඳ භේදයකින් තොරව සියළු රාජ්‍යයන් එක් හඬකින් එක් සම්මුතියක් වෙත ප්‍රවේශ වීම හරහා ඒවා මතු වීමත් හේතුවෙන් ඒවා බෙහෙවින් වැදගත් බවට පත්ව ඇත. II වන ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු පලවන අභ්‍යවකාශය සයිබර් අවකාශය සහ මුහුදු ක්ෂේත්‍රය ආදී සියළු කෂේත්‍ර සඳහා වූ ප්‍රවේශය ආරක්ෂා කිරීමට එමගින් අඩිතාලම සපයා ඇත. එකී ප්‍රතිපත්තිවලට ගරු කිරීම

හා ඒවාට අනුගත වීම සඳහා අප විසින් සාමූහික ලෙස  පියවර ගැනීම හරහා කලාපීය ආර්ථිකය වේගවත් සහ ඵලදායී ලෙස වර්ධනය වී ඇත.

කලාපය පුරා නැගෙන මෙම සෞභාග්‍යයේ රළ හේතුවෙන් මිලියන සංඛ්‍යාත ජනතාවක් දරිද්‍රතාවයෙන් අත් මිදී ඇති අතර එම සෞභාග්‍යය තවදුරටත පුළුල් කර ගැනීම සඳහා වූ විභවතාවයන් තවත් බොහෝ ඇත. එය සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ සාමුහික හැකියාව සහ  නීතිරීති වලට අවනතව කටයුතු කිරීම තීරණාත්මකය.

පසුගිය වසරේදී පැවති ඉන්දියානු සාගර නාවික සම්මේලනයට සහභාගී වූ මා එහිදීපැවසුවේ 'මා දැන් මලක්කා සමුද්‍ර සන්ධියේ සිට බටහිර ශාන්තිකර කලාපය දෙස බැලූ කල කාලයක් තිස්සේ දිග්ගැස්සුණු ආරවුල් ගණනාවක් පෙනෙන අතර, ස්ථාපිත කොට ඇති යාන්ත්‍රණයන් භාවිතා කරමින් සහ ජාත්‍යන්තර නීතියට අනුව ඒවා නොවිසඳියහොත් එය අපගේ සාමූහික සංවර්ධනය කඩාකප්පල් කරනු ඇති' බවයි. එකී ප්‍රමිතීන් වලට අවනත නොවුවහොත් අප නැවත වරක් අස්ථාවර කොට දමනු ඇත.

ඉන් මාස කිහිපයකට පසුව පැවති බාහිර ශාන්තිකර නාවික සමුළුවේදී මා පැවසුවේ අන්තර් කලාපීය අස්ථාවරත්ව ප්‍රවනතාවය හේතුවෙන් ඉන්දියානු සාගර කලාපය  බලපෑමට ලක්විය හැකි බවයි. නැගෙනහිර යුරෝපය, ලෑවන්ට් සහ මැග්රෙබ් ප්‍රදේශ වෙත බැලූ කල යුක්රේනය, සිරියාව සහ ලිබියාව යන රටවල පවතින ගැටුම්කාරී තත්ත්වයන් බරපතල ලෙස නිරීක්ෂණයට ලක් වේ.

මධ්‍යධරණී මුහුද සහ කලු මුහුද යන නාවික ප්‍රදේශවල පවතින වෙරළ ආශ්‍රිත ගැටුම්කාරී තත්ත්වයන් ප්‍රසාරණය වීම හේතුවෙන් එම කලාපයේ සංවර්ධනය අඩාල කරවන බව මා දුටිමි. සහයෝගය වෙනුවට බලය භාවිතා කිරීම (සමුද්‍රීය ගනුදෙනු වලදී) අස්ථාවරත්වයට මග පාදන බව උක්ත උදාහරණ ආශ්‍රිතව මා පැහැදිලි කළෙමි.

ඉන්දියන් සාගරයේ දෙපස දක්නට ලැබෙන නොරිස්සුම් සහගත තත්ත්ව සමග සාපේක්ෂ වශයෙන් බැලු කල සිය වෙරළ තීරයන් ආරක්ෂා කොට තබා ගත් ජාතීන් සාමකාමී සමුදායක ප්‍රතිලාභ ලැබුවන් බවට පත් වීඇත. එබැවින් මා ඇසුවේ මෙය මෙසේ සිදුව ඇත්තේ මන්ද කියාය. ඉන්දියානු සාගරය සීමාවේ පිහිටි රටවල් (සිය ප්‍රමාණය,ධනය සහ බලපෑම යන සාධක අතර පවතින අසමානතාවයන් තුල වුවත්)  සිය දීර්ඝකාලින සමුද්‍රීය සීමාවන් පිලිබඳ ගැටලු  සාකච්ඡාවෙන් සහ සම්මුතියෙන් බේරුම්කරණය වෙත රැගෙන විත් ඇති අතර දකුණු චීන මුහුදේ සහ වෙනත් ප්‍රදේශවල සබඳතාවයන්ට බාධා කරන්නා වූ,  අවිශ්වාසය, සැකය සහ විනිවිදභාවය නොමැති වීම ආදී ගැටලු නිරාකරණය කොට  ගෙන ඇත. ජාත්‍යන්තර නීති පාදක පිළිවෙත් හරහා ඉන්දියානු සාගර කලාපීය රටවල් අතර සුභවාදී තරංගයක් නිර්මාණය වී ඇති අතර එය සමස්ත උප කලාපයටම ප්‍රතිලාභ අත්පත් කර දෙන්නා වූ සහයෝගිතා ආරක්ෂක පරිසරයක් නිර්මාණය කොට ඇත.   අනෙකුත් කලාපයන්ද එය අනුගමනය කිරීම හරහා ප්‍රතිලාභ අත්පත් කොට ගනු ඇත.

අප මුහුණ දෙන සාමූහික අභියෝගයන් සඳහා සහයෝගිතාවයෙන් යුතුව  විසඳුම් සෙවීම සඳහා සමුද්‍රීය කටයුතුවලදී සාමූහිකත්වය තීරණාත්මකය.

අප එකිනෙකා සම්බන්ධ කරනු ලබන සහ ජාතික සෞභාග්‍යය සහ වඩා යහපත් ජීවන තත්ත්වයන් ඇති කර ගැනීම සඳහා වූ අසීමිත ඉඩ ප්‍රස්ථාවන් නිර්මාණය කරන්නා වූ සාගරය අපගේ ජාතික ආරක්ෂාව අනතුරේ හෙලන්නා වූ බෙදීම් සහ ගැටුම් ජනනය කරන ස්ථානයක් බවට පත්විමටද පාදක වන බව අප අමතක නොකළ යුතුය.

වර්ග සැතපුම් මිලියන 28කට අධික වපසරියකින් යුත් ලෝක පෘෂ්ඨයෙන් සියයට විස්සක පමණ ප්‍රමාණයක් ආවරණය කරන ඉන්දියන් සාගරය බහු පාර්ශ්වීය සහයෝගිතාවය වෙනුවෙන් ඉටු කරන්නා වූ කාර්යභාරය කිසි විටෙකත් සුළුපටු නොවේ. ඉන්දියන් සාගරය හරහා ලොව කන්ටේනර් ප්‍රවාහනයෙන් අඩක්, තොග භාණ්ඩ ප්‍රවාහනයෙන් තුනෙන් එකක් සහ ලෝකයේ සමුද්‍රීය තෙල් පරිවහනයෙන් තුනෙන් දෙකක් පමණ ප්‍රමාණයක් හුවමාරු වේ. මෙකී ප්‍රවාහනයන්ට යම් බාධාවක් පැමිණියහොත් එය රාජ්‍යයන් ගණනාවකට බරපතල ගැටළු මතු කරයි. එසේම මෙම මාර්ගයන් හරහා සිදුවන මුහුදු කොල්ලකෑම්, ජාවාරම්, මිනිස් ජාවාරම්, නීතිවිරෝධී මසුන් මැරීම සහ අන්තර් රාජ්‍ය ත්‍රස්තවාදය ආදී අභියෝග රටවල ආරක්ෂාවට ප්‍රබල තර්ජනයක් එල්ල කරයි. එසේ සිදුවන්නේ එම ප්‍රදේශවල ආරක්ෂාව ගැටළු සහගත, දැඩි මතභේදයට තුඩු දී ඇති සහ නිසි ලෙස සිදු නොවීම හේතුවෙනි.

මෙම අභියෝගයන් ජය ගැනීම සඳහා කාලීන නිරවද්‍ය සහ ක්‍රියාවට නැංවීම අරමුණු කොටගත් තොරතුරු සේම ප්‍රතිචාර දැක්වීම සඳහා ඉලක්කගත වූ බලකායක්ද අවශ්‍යය. කෙසේ වෙතත් ප්‍රදේශයේ ප්‍රමාණය විශාල වීම සහ විශාල වියදමක් දැරීමට සිදුවන කටයුත්තක් වීම හේතුවෙන් එක් රාජ්‍යයකට ඒවා නිසි ලෙස අධීක්ෂණයට ලක් කොට ආරක්ෂාව සපයාදීම අපහසු වී ඇත.

එවන් සන්දර්භයක් තුළ සමාන ලෙස කල්පනා කරන පාර්ශ්වයන්ට සහ මිතුරන්ට එක්ව එම අභියෝගාත්මක කාර්යයේ බලපෑම අවම කළ හැකි අතර ඒ සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම හා ඒකාබද්ධ මුර සංචාර ක්‍රියාත්මක කිරීම ආදී ක්‍රමවේදයන් වෙත ප්‍රවේශ විය හැකිය. එවන් මූලාරම්භයක් හරහා සාමූහික සමුද්‍රීය අවබෝධය ඉහළ යෑම, විශාල මෙහෙයුම් ප්‍රදේශයන් තුළ ඇති සීමිත සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ සමුද්‍රීය අභියෝගයන් මුල් බැස ගැනීමට ඇති ඉඩකඩ අවම කිරීමට අවකාශ සැලසේ. කෙසේ වෙතත්, එවන් විශාල කටයුත්තක් ඉටු කිරීමේදී තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ඒකාබද්ධව මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයන් අතර යම් මට්ටමක විශ්වාසයක් තිබිය යුතුය. නමුත් ගැටළුව වන්නේ එවන් දෙයක් වෙත යොමුවීමට ජාතික බලකායන් ස්වභාවයෙන්ම දක්වන අකමැත්තයි. එම අකමැත්ත වගකිවයුතු ලෙස ජය ගැනීමට අප කළ යුත්තේ කුමක්ද ?

බහු පාර්ශ්වීය සහයොගිතාවන්, ව්‍යායාමයන් සහ අද මෙම ස්ථානයේ සිදුවන වෘත්තිය කතිකාවන් ආදී මූලාරම්භයන් හරහා උක්ත කටයුතු වලට සහභාගි වන බලකායන් අතර අවබෝධයක් සහ අන්තර් මෙහෙයුම් ක්‍රියාකාරි බව වර්ධනය වන අතර හවුල්කාර පාර්ශ්වයන් අතරඇති මිත්‍රත්වය වර්ධනය වේ. කෙටියෙන කිවහොත් ඒ හරහා සබඳතා ගොඩනැගී විශ්වාසය තහවුරු වේ. විශ්වාසය ඇති කරගැනීම දුෂ්කර කාර්යයක් වන නමුත් කලාපීය ස්ථාවරත්වය සහ නීතිපාදක පිළිවෙත් ඉදිරියට ගෙන යාමේදී එය අත්‍යවශ්‍ය සාධකයකි. අප විසින් විශ්වාසය ගොඩ නගා නොගතහොත් එය අපගේ විනාශයට මුල බීජය වනු ඇත.

නීති පාදක ප්‍රවේශය තිරසාර බවට පත් කරන්නා වූ සහ සියළු ජාතීන්ගේ ප්‍රතිලාභය උදෙසා සමුද්‍රයන් වල නිදහස ආරක්ෂා කිරීම වෙනුවෙන් විශ්වාසය ගොඩනගා ගැනීම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

පසුගිය මැයි මාසයේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් ගංවතුර උවදුරේදී විවිධ රටවල් සිය නාවික බලකායන් ශ්‍රී ලංකාවට එවීය. වගකිව යුතු නාවික හමුදාවන් එසේ කටයුතු කරන අතර ශ්‍රීලංකාවට අවශ්‍ය සහාය ලබා දීම සඳහා ඉදිරිපත් වීම වෙනුවෙන් යුහුසුළුව කටයුතු කළ සියලු නාවික ප්‍රධානීන් වෙත මා මාගේ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

පසුගිය ජුනි මාසයේදී පැවති CARAT 2017 ව්‍යායාමයේ කොටසක් ලෙස එක්සත් ජනපද ශාන්තිකර බලකායක් ශ්‍රී ලංකා නාවික හමුදාව සමග එක් විය. CARAT ආදී ක්‍රියාකාරකම් හරහා අපගේ හමුදාමය සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමට මා උදක්ම කැමැත්තෙන් සිටිමි. එවන් ව්‍යායාමයක් හරහා විශ්වාසය ගොඩ නගා ගැනීමට සහ බහු පාර්ශ්වීය අභියෝගයන් ජය ගැනීමට අපට අවස්ථාව උදා වේ.

අපගේ බලකායන් අතර විශ්වාසය ගොඩ නගා ගැනීමේදී පුලුල් පරාසයක් තුළ ආරක්ෂාව සැපයීමට ඇති අපගේ හැකියාව තවදුරටත් පුළුල් වේ. බටහිර ඉන්දියානු සාගරය තුළ සිදුවූ මුහුදු කොල්ලකෑම් සහ සොරකම් හේතුවෙන් සෝමාලියානු ජනතාවට මානුෂීය ආධාර ලබාදීමේ ක්‍රියාවලිය අඩපන වූ අතර එය වැදගත් මුහුදු මාර්ගයන්ට තර්ජනයක් ද විය. 2012 වසරේදී පමණක් මුහුදු කොල්ලකෑම් හේතුවෙන් රාජ්‍යයන්ට සහ නැව් කර්මාන්තයට දරන්නට සිදුවූ පාඩුව ඩොලර් බිලියන 7 ක් ලෙස ගණන් බලා තිබේ. මෙම තර්ජනය යම් මට්ටමකට පාලනය කර ගැනීම සඳහා සමුද්‍රීය රාජ්‍යයන් සහ ඒවායේ නාවික හමුදාවල ඒකාබද්ධ ප්‍රතිචාරයන්, එ.ජා. යෝජනාවන් සහ යහපත් පිලිවෙත් සහ ප්‍රතිපත්ති අදාල පරිදි ගලපා ගැනීම ආදී ක්‍රමවේදයන් ඉවහල් විය.

ඉන්දුනීසියාව, මැලේසියාව, සහ සිංගප්පූරුව එක්ව සිදුකළ මෙහෙයුම් හේතුවෙන් මුහුදේ සිදුවන අපරාධ සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත.

ජාතීන් සහ ඒවායේ නාවික බලකායන් හට විශ්වාසය ගොඩ නගා ගැනිම සඳහා වූ හැකියාව ඇති වුවද ජාත්‍යන්තර අවකාශය තුළ දේශීය නිති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම හරහා බහු පාර්ශ්වීය වශයෙන් අත්පත් කරගත හැකි විශ්වාසය පලුදු වේ.

මෙකී යථාර්ථයන් ඉන්දියානු සාගර කලාපයට අවතීර්ණ වීමත් සමග ඉන්දියානු සාගරය සාමකාමි කලාපයක් බවට පත් කර ගැනිම අතිශයින් ගැටලුකාරී බවට පත්ව ඇත. එහි වෙරළ තීරයන් අතර මතුවෙමින් පවතින අස්ථාවරත්වයන් සහ හානිකර තරඟකාරිත්වය සැබැවින්ම කණගාටුදායකය. මා උදක්ම අපේක්ෂා කරන්නේ මෙම සහයෝගිතාවය සැබෑ ලෙසම සියලු රාජ්‍යයන්ට ප්‍රතිලාභ ගෙන එන්නා වූ ව්‍යායාමයක් බවට පත් වේවා කියාය.

සියළු ජාතීන් හට සාමකාමි, විශ්වාසවන්ත, සුරක්ෂිත සහ ආර්ථික වශයෙන් ප්‍රතිලාභ අත්වන්නා වූ අනාගතයක් හිමි කර ගැනීමට නම් නීති පාදක ප්‍රවේශය අනුගමනය කළ යුතු බව මාගේ විශ්වාසයයි.

එසේම ඉන්දියානු සාගර කලාපය ආශ්‍රිත රටවල් විසින් සිය විෂමතාවයන් (ප්‍රමාණය, ශක්තිය, ධනය ආදි) අමතක කොට සාකච්ඡා මාර්ගයෙන් ඉන්දියානු සාගර කලාපයේ සුරක්ෂිතතාවය සහ ඵලදායිතාවය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කොට කටයුතු කරනු ඇති බවත් මාගේ විශ්වාසයයි. සියලු ජාතින් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට මෙන්ම ශක්තිය, බලය' ප්‍රමාණය, ධනය ආදි සාධක වලින් ඔබ්බට ගිය ජාත්‍යන්තර සුරක්ෂිතතාවයක් වෙනුවෙන් සියලු දෙනා සමග සුහදශිලී ලෙස කටයුතු කිරීමටත් මා අපේක්ෂා කරමි.

ස්තූතියි.